# දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 05/2009

මගේ අංකය- ප/13/3/5.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.
2009.08. 28

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
සියළුම අධ්‍යක්ෂවරුන් වෙත.

## රාජකාරි වේලාවන්-දෙපාර්තමේන්තුමය ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින්.

මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුමය ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ගේ රාජකාරි වේලාවන් නියම කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තු චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. සතියේ වැඩ කරන දින 05 මෙන්ම සති අන්තයේ ද රාජකාරී කළයුතු සේවා ආයතන වලට අනුයුක්තව සේවය කරන දෙපාර්තමේන්තුමය ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් සතියකට පැය 48 ක කාලය ආවරණය වන පරිදි වැඩකරන වේලාවන් ඒකක ප්‍රධානීන් විසින් නියම කරගත යුතුය.

03. ඒකාබද්ධ සේවයට අයත් ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන්ගේ (රියදුරන් හැර) කාර්යාල වේලාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.162 අනුව පෙ.ව. 8.00 සිට සිට ප.ව. 4.45 දක්වා විය යුතුය.

04. ඉහත රාජකාරී වේලාවන්ට අමතරව, සේවයේ යොදවන සේවකයන්ට අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

05. ඒ අනුව, ඔබ අංශය යටතේ අධීක්ෂණය වන සියළු ඒකකවල ප්‍රධානින් මේ පිළිබඳව දැනුවත් කිරීමට ද අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

එච්.එම්.එස්.පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් -

01) විගණකාධිපති - දැ.පි.

02) දෙපාර්තමේන්තුමය ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් අනුයුක්ත සියළුම ඒකකභාර නිලධාරීන් - දැ.පි.